දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone )0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )NA/07/01/2018
எனது இல
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2019.05.17
Date )

සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதார,போசணை மற்றும் சுதேசவைத்திய அமைச்சு
Ministry of Health, Nutrition& Indigenous Medicine

---

හෙද පරිපූරක,අතුරු වෛද්‍ය සේවයේ සම්මුඛ පරීක්ෂණයට පැමිණීමට නියමිත අයදුම්කරුවන් වෙත,

**<u>හෙද පරිපූරක,හා අතුරු වෛද්‍ය සේවයේ පුහුණුවට බඳවා ගැනීම- 2018</u>**

හෙද පරිපූරක,අතුරු වෛද්‍ය සේවයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට නියමිත දෙවන කණ්ඩායමේ නාම ලේඛනය මේ වනවිට වෙබ් අඩවියේ පලකර ඇත. අදාල අයදුම්කරුවන්ගේ සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වීමට නියමිත අතර සම්මුඛ පරීක්ෂණයට කැඳවන දිනය එක් එක් අයදුම්කරුවන් වෙත ලිපි මඟින් හා කෙටි පණිවුඩ මඟින් ඉදිරියේදී දැනුම් දෙනු ඇත.

02. ඒ අනුව පහත ලිපි ලේඛන වල මුල් පිටපත් හා සත්‍ය බවට තමන් විසින් සහතික කරන ලද ඡායා පිටපත් ද රැගෙන නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට සූදානම් වන මෙන් දන්වා සිටිමි.

03. ඡායා පිටපත් සියල්ල කාඩ්බෝඩ් ලිපි ගොනු කවරයක අමුණා කවරයේ ඉහළ දකුණු පස ඔබගේ නම,ජාතික හැඳුනුම්පත් අංකය හා කැඳවීම් අංකය සටහන් කරගෙන පැමිණීමට කාරුණික වන්න.ඔබ විසින් පහත සඳහන් ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී ඉදිරිපත් කල යුතුය.

i. උප්පැන්න සහතිකය.
ii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
iii. අයදුම් කළ වර්ෂයට අදාළ අ.පො.ස. (උ/පෙළ ) විභාග ප්‍රතිඵල ලේඛන හා Z අගය දැක්වෙන සහතිකය. (විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.)

iv. අ.පො.ස. (සා/පෙළ ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය.(විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.)

v. අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද දිව්රුම් ප්‍රකාශයක්.දිව්රුම් ප්‍රකාශයේ රු. 50/- ක මුද්දර අලවා ඒ මත අත්සන් කල යුතුය. (අවිවාහක බව සනාථ කල යුතු තනතුරු සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන්ට පමණක් අදාල වේ)

vi. විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ / සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පාඨමාලාවකට ලියාපදිංචි වී හෝ සහභාගි නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.

---

vii. උප්පැන්න සහතිකය හා අධ්‍යාපන සහතික හෝ වෙනත් ලේඛනවල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් සාමදාන විනිශ්චකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. (දිව්රුම් ප්‍රකාශයේ රු 50/- මුද්දරයක් අලවා ඒ මත අත්සන් කල යුතුය.)

**viii.** 2018.09.21 දිනට පූර්වාසන්න වසර තුනක් තුල අදාල දිස්ත්‍රික්කයේ අඛණ්ඩව පදිංචිව සිටි බව සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කල ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල යුතුය. **( අදාල ග්‍රාම නිලධාරි සහතිකය 2018.11.25 දිනෙන් පසු නිකුත් කරන ලද්දක් විය යුතුය.)**

ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල නොහැකි අවස්ථා වලදී පමණක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගත් පූර්වාසන්න වසර 03 ක ඡන්ද හිමි නාම ලේඛන වල උපුටන ඉදිරිපත් කළ යුතුය .

(ඔබගේ නම ඡන්ද නාම ලේඛනයේ නොමැති නම් ඔබගේ දෙමාපියන්ගේ නම් එහි ඇතුලත් විය යුතුය. එවැනි අයදුම්කරුවෙකු ඡන්ද නාම ලේඛනවල පිටපත් වලට අමතරව අයදුම්කරු ඡන්ද නාම ලේඛනයේ නම සඳහන් දෙමාපියන්ගේ දුව හෝ පුතා බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිළධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.)

04. ඉහත දැක්වෙන ලිපිලේඛන වලින් එකක් හෝ සම්මුඛ පරීක්ෂන දිනයේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔබ නුසුදුසු අයදුම්කරුවකු වන බව දන්වමි. ඔබ විසින් ඉහත සඳහන් ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේනම් ඒ සම්බන්ධව පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

05.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ගැසට් නිවේදනයේ විධිවිධාන වලට අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.(මෙය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් පමණි.සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පමණින් ඔබ අනිවාර්යයෙන් පුහුණුවට බඳවා ගන්නා බවක් මින් අදහස් නොවන බව සැලකිය යුතුය. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ /නුසුදුසු වූ හා තෝරා ගන්නා / තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳව තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පල කරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.)



ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)02
ලේකම් වෙනුවට
සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.